# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2105/14 - 2019 ජනවාරි මස 07 වැනි සඳුදා - 2019.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ARA/LND/ACQVI/D3/41.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ අංකය* : 4-3/15/2016/VE/414.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාවය ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තුන්පළාත පත්තුව සුළු කොට්ඨාසයේ අංක 42ඒ, දුල්දෙණිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දුල්දෙණිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2018.06.22 දිනැතිව පිළියෙල කරන ලද අංක මු.පි.කෑ.3603 දරන මූලික පිඹුරේ කැබැලි අංක 01 හා 02 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8159 පමණ වූ දුල්දෙණිය වත්ත නැමැති ඉඩම සඳහා මායිම්;

01. **කැබලි අංක 01 - ඉඩමේ නම: දුල්දෙණිය වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3698;**

*උතුරට*: මාර්ග (ප්‍රාදේශීය සභා) සහ දුල්දෙණිය වත්ත; *නැගෙනහිරට*: දුල්දෙණිය වත්ත; *දකුණට*: දුල්දෙණිය වත්ත; *බටහිරට*: මාර්ග (ප්‍රාදේශීය සභා).

*වෙනත් කරුණු* :- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වන වගන්තිය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නේ තල්ගස්පිටිය, තැඹරව පදිංචි එස්. ඕ. එන්. එන්. මූර්ති සහ අරණායක, ගැවිලිපිටිය, ඇහැලගස්තැන්න පදිංචි පී.ඩී. විමලසේන අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.

02. **කැබලි අංක 02 - ඉඩමේ නම: දුල්දෙණිය වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4461;**

*උතුරට*: මල ඇළ සහ දුල්දෙණිය වත්ත; *නැගෙනහිරට*: දුල්දෙණිය වත්ත සහ මාර්ග (ප්‍රාදේශීය සභා); *දකුණට*: මාර්ග (ප්‍රාදේශීය සභා), මාර්ගය සහ දුල්දෙණිය වත්ත; *බටහිරට*: මල ඇළ.

*වෙනත් කරුණු* :- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වන වගන්තිය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නේ තල්ගස්පිටිය, තැඹරව පදිංචි එස්.ඕ.එන්.එන්. මූර්ති සහ අරණායක, ගැවිලිපිටිය, ඇහැලගස්තැන්න පදිංචි පී.ඩී. විමලසේන අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2019 ජනවාරි මස 28 වැනි දින පෙ.ව. 10.00ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019 ජනවාරි මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඉසෙඩ්. ඒ. එම්. ෆයිසල්,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2019 ජනවාරි මස 04 වැනි දින,
අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-518

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.